# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,417 - 2024 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |

| | පිටුව |
|---|---|
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2024 දෙසැම්බර් මස 25 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**දීපා නිලන්ති ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1 - B 082640 — 177 (2024/12)
C 1 -

# පිස්කල් විකිණීම්

**හොරණ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

වෙත්තසිංහ හල්ගමු අප්පුහාමිලාගේ දොන්
නන්දික ධනුෂ්ක ඩයස්,
අංක 464/7, මීටිගොඩ පාර,
රෙමුණ, අඟුරුවාතොට.

.............*පෙත්සම්කරු.*

නඩු අංකය : SP/3103/2021
ඇස්කිසි අංකය : 32/2024

*එදිරිව*

මාරඹ හේවගේ සේනක සුනන්ද,
අංක 28, සුදේරිස් සිල්වා මාවත,
හොරණ.

.............*වගඋත්තරකරු.*

ඉහත අංක දරන නඩු වාර්තාවට ඇතුළත් කර ඇති වර්ෂ 2023.03.07 දිනැති නියෝගය පරිදි ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශයට අනුව පෙත්සම්කරුට වගඋත්තරකරුගෙන් රුපියල් හාරකෝටි තිස්පන් ලක්ෂ අසූ තුන් දහස් හත්සිය හතලිස් හයයි ශත විසි එක (රු. 43,583,746.21) ක මුදල අයකර ගැනීමට අයිතිය ඇති බවට තීන්දු කර ඇති හෙයින් එකී වගඋත්තරකරු විසින් එම මුදල ගෙවීමට අපොහොසත් වී ගෙවීම පැහැර හැර ඇති හෙයින් මා විසින් තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2025ක් වූ ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 11.00 ට,**

මා විසින් කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ කුඹුකේ පත්තුවේ හොරණ නගර සභා බල සීමාව තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 615 ඒ හොරණ දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ හොරණ පිහිටි හොරණ නගර සභා සීමාවට අයත් අංක 05 දරන කොට්ඨාසයේ සුදේරිස් සිල්වා මාවතේ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, හොරණ නගර සභා බලසීමාව තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 615 ඒ හොරණ දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ හොරණ පිහිටි හොරණ නගර සභා සීමාවට අයත් අංක 5 දරන කොට්ඨාසයේ සුදේරිස් සිල්වා මාවතේ වරිපනම් අංක 87 දැනට 28/02/01 සහ 28 දරන වර්ෂ 1998.07.11 දින එම්. ඩී. බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 2968 දරන පිඹුරේ සඳහන් රාළහාමිලාගේ වත්තේ "ඒ" අක්ෂරය දරන කට්ටියට මායිම්,

*උතුරට* : කිච්. ආර්. /4/1 ඒ දරන (ලංකා බැංකුවට අයත්) මෙම ඉඩමේ කොටසක් ද,
*නැගෙනහිරට* : කිච්. ආර්./4/2 දරන (සුදේරිස් සිල්වා මාවත) කට්ටිය ද,
*දකුණට* : ඩී අක්ෂරය දරන කට්ටිය ද,
*බස්නාහිරට* : කිච්. ආර්./4/1 ඒ දරන (ලංකා බැංකුවට අයත්) මෙම ඉඩමේ කොටසක් ද,

මායිම් වූ පර්චස් දෙක (පර්. 02) ක් *හෙවත්* හෙක්ටයාර් 0.00506 ක් විශාලකම ඇති ඉඩමේ බිම සහ එකී බිම් තුළ පිහිටි මහල් තුනකින් යුත් ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ම වේ. මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 294/135 පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

පී. ආර්. ජයලත්ආරච්චි ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - හොරණ.

වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින,
හොරණ දිසා අධිකරණයේ දී ය.

12-403

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පී. එල්. සී.,
අංක 84, වෝඩ් පෙදෙස, කොළඹ 07.

නඩු අංකය : HC/CIVIL/301/2018/MR
ඇස්කිසි අංකය : 97/2022
ස්වභාවය : උකස්
ක්‍රියා පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 14,463,883.57/-

...........*පැමිණිලිකරු.*

*එදිරිව*

වටරුක ලියනගේ සෞම්‍යදාස,
අංක 200, දිසානායක වත්ත,
උඩගම, ඇඹිලිපිටිය.

............*විත්තිකරු.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත නම් දරන නඩුවේ ඇතුළත් 2022 ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දින විත්තිකරුවන් විසින් ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව,

විත්තිකරු විසින් පැමිණිලිකරුට,

(*අ*) ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට එක්කෝටි හතළිස් හතර ලක්ෂ හැටතුන් දහස් අටසිය අසූ තුනයි ශත පනස් හතක (රු. 14,463,883.57) ක මුදල හා ඒ මත පොළිය ද ගෙවීම පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබා දෙන ලෙසටත්,

(*ආ*) විත්තිකරු ඉහත එක්කෝටි හතළිස් හතර ලක්ෂ හැටතුන් දහස් අටසිය අසූ තුනයි ශත පනස් හතක (රු. 14,463,883.57) යන මුදල හා නෛතික පොලිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 17 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසත්,

(*ඇ*) නඩු ගාස්තු ලබා දෙන ලෙසත්, තව ද, සමථය පරිදි මේ වන තුරු අප ආයතනය වෙත ගෙවා නොමැති බැවින්, පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති සහන ලබා ගැනීම සඳහා ඇස්කිසි ක්‍රියාත්මක කිරීමට ඇති බව ය.

01. පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති ආකාරයට පැමිණිලිකරුගේ වාසියට විත්තිකරුට විරුද්ධව නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීමට විත්තිකරු එකඟ වූ බවටත්,

02. කෙසේ වුව ද, විත්තිකරු පහත සඳහන් අයුරින් රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-) ක මුදලක් ගෙවනු ලැබුවහොත් නඩු තීන්දුව ඉටුකළා සේ සැලකීමට පැමිණිලිකරු එකඟ වූ බවටත්,

03. ඉහත කී සමථය ප්‍රකාරව රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-) ක මුදල වර්ෂ 2022ක් වූ නොවැම්බර් මස 13 වැනි දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවීමට විත්තිකරු එකඟ වූ බවටත්,

04. කෙසේ වුව ද, එකී සම්පූර්ණ සමථය වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 13 වැනි දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවා අවසන් කිරීමට ද, විත්තිකරු එකඟ වූ බවටත්,

05. වර්ෂ 2022ක් වූ නොවැම්බර් මස 13 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් සම්පූර්ණ සමථ මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියහොත් මෙම සමථය ප්‍රකාරව අද දින සිට යම්කිසි මුදලක් ගෙවා ඇත්නම් එම මුදල අඩුකර නඩුව තීන්දු කර ඇති සම්පූර්ණ මුදල ලබා ගැනීමට සහ ඇස්කිසි ලබා ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට විත්තිකරු එකඟ වූ බවටත්,

06. අවුරුද්දක කාලයක් ගත වුව ද, විත්තිකරුට විරුද්ධව කිසිදු නොතීසියක් නොමැතිව ඇස්කිසි ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට විත්තිකරු එකඟ වූ බවටත්,

07. එසේ ඇස්කිසි ගැනීමට සිදුවුවහොත් ඇස්කිසි ගැනීමේ සියලුම ගාස්තු සහ වියදම් විත්තිකරු විසින් දැරිය යුතු බවට විත්තිකරු එකඟ වූ බවටත්,

08. විත්තිකරු විසින් ඉහත කී සමථය ප්‍රකාරව ගෙවිය යුතු සම්පූර්ණ මුදලවන රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-ක මුදල වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 13 වැනි දින හෝ ඊට පෙර ගෙවා අවසන් කළ පසු,

(අ) මෙම නඩුවේ විෂයගත දේපල සඳහා ලියාපදිංචි කර ඇති ලිස්පෙන්ඩනය අවලංගු කිරීමටත්, මෙම නඩුව පවරා ඇති නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 17 සහ 2016.02.17 වැනි දින දරන ණය උකස්කරය අවලංගු කිරීමට සහ අවලංගු කළ ණය උකස්කරය විත්තිකරු වෙත නැවත ලබා දීමටත්, පැමිණිලිකරු එකඟ වූ බවටත්,

09. මෙකී සමථය ප්‍රකාරව සියලු මුදල් ගෙවා නිම කිරීමෙන් පසුව, ඉහත කී නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 17 සහ 2016.02.17 වැනි දින දරන උකස්කරයෙහි උපලේඛනයේ දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් කිසිදු හිමිකමක් සහ/හෝ අයිතිවාසිකමක් ඉදිරිපත් නොකරන බවට පැමිණිලිකරු එකඟ වූ බවටත්, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව, ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත්, පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල,

**වර්ෂ 2025ක් වූ ජනවාරි මස 09 වැනි දින පෙ. ව. 11.30 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම්පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ, උඩුගම 214 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇඹිලිපිටිය - උඩුගම ග්‍රාමයේ "ජාසින් ජාගොඩගේ පංගුව කොටස" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඉරන්දතිස්ස කොටඹගේ මහතා විසින් මැන සාදන ලද අංක 1320 සහ 1996.03.26 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 6 කැබැල්ලට මායිම්, උතුරට : ලොට් අංක 9 ද, නැගෙනහිරට : FVP 778 හි ලොට් අංක 575 හි කොටසක් ද, දකුණට : ලොට් අංක 5 ද, බටහිරට : ලොට් 16 (මාර්ග අයිතිය) යන මායිම් ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයක (පර්. 20.6) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ. (මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 49/64 හි ලියාපදිංචි වී ඇත.)

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතුය.
02. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතුය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ඇඹිලිපිටිය.

වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 08 වැනි දින දී ය.

12-340

**කෑගල්ල දිසා අධිකරණය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085, කොළඹ 02.
සහ අංක 371, කෙලින් වීදිය, කෑගල්ල.

කෑගල්ල දිසා අධිකරණ
නඩු අංක : 1079 MB
මාවනැල්ල දිසා අධිකරණ
ඇස්කීසි අංක : 184

.............*පැමිණිලිකරු.*

*එදිරිව*

විමලසූරිය ගජසිංහගේ චමින්ද රෝහණ කුමාර,
අරඹේවත්ත, තබරව, තල්ගස්පිටිය, අරණායක.

...............*විත්තිකරු.*

වර්ෂ 2020ක් වූ නොවැම්බර් මස 11 වැනි දිනැති තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරු විසින් ලබා ගත් ණය මුදල ගිවිස ගත් ආකාරයට ගෙවීම පැහැර හැරීම හේතුවෙන් වර්ෂ 2017.07.31 වැනි දිනට පැවති ණය මුදලේ ශේෂයවන රුපියල් පන් ලක්ෂ විසිහත් දහස් හාරසිය හතලිස් හතයි ශත පනහක් (රු. 527,447.50) ක් ද, එදිනට නොගෙවා පැහැර හැර ඇති වාරිකවලට අදාළ ණය මුදලේ කොටස වන රුපියල් හතලිස් නව දහස් පන්සිය හැත්තෑ තුනයි ශත හැත්තෑ හයක් (රු. 49,573.76) ක් ද, ඒ අනුව ණය මුදලේ ගෙවිය යුතු මුළු ශේෂය රුපියල් පන් ලක්ෂ හැත්තෑ හත් දහස් විසි එකයි ශත විසි හයක් (රු. 577,021.26) වේ. එදිනට නොගෙවා පැහැර හැර ඇති වාරික මත එකතු වී ඇති හිඟ පොලී මුදලවන රුපියල් අනූපන් දහස් එකසිය හැට පහයි ශත අනූ හතක් (රු. 95,165.97) ක් ද, එලෙස නොගෙවා පැහැර හරින ලද හිඟ වාරික මුදල් සඳහා එකතු වී ඇති ප්‍රමාද පොලියවන රුපියල් දහ හතර දහස් පන්සිය නවයයි ශත හැට හතක් (රු. 14,509.67) ක මුදලක් ද, සහ බැංකුව විසින් විත්තිකරු වෙත සපයනු ලබන සේවාවන් වෙනුවෙන් බැංකුවට දැරීමට සිදුවී ඇති අනෙකුත් වියදම් සඳහා රුපියල් දෙසීයයි ශත එකක් (රු. 200.01) ක් ද සමග ඉහත කී දිනට ගෙවිය යුතු සම්පූර්ණ මුදලවන රුපියල් හය ලක්ෂ අසූ හයදහස් අටසිය අනූ හයයි ශත අනූ එකක් (රු. 686,896.91) ක් ද, තව ද, එසේ නොගෙවන්නේ නම් 2017.08.01 වැනි දින සිට ඉදිරියට පවතින ණය මුදලේ ශේෂය මත වාර්ෂිකව 15% ක පොළියක් ද, මෙතෙක් නොගෙවන ලද හිඟ මාසික වාරික මුදල් සහ ඉදිරියට නොගෙවා පැහැර හරිනු ලබන මාසික වාරික මුදල් ද, සම්පූර්ණයෙන් ගෙවා අවසන්වන තුරු එකී මුදල මත ඉහත කී 2017.08.01 දින සිට වාර්ෂිකව 16% බැගින් වූ අමතර පොළියක් ද ඉදිරියේ දී පැන නැගිය හැකි වෙනත් වියදම් ද, මෙම නඩුවේ තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට අදාළ සම්පූර්ණ මුදල ම අයකර ගන්නා දිනය තෙක් එකී සම්පූර්ණ මුදල මත නෛතික පොළිය ද අයකරවා ගැනීම සඳහා ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් මා විසින් තහනමට ගනු ලැබූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල සම්බන්ධයෙන් ඔවුන්ට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම්,

වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 30 වැනි දින එම දේපල පිහිටි ස්ථානයේ දී ප. ව. 12.30 ට,

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ප්‍රවේශ මාර්ගය.*- මාවනැල්ල නගරයේ සිට අරණායක මාර්ගය ඔස්සේ දිප්පිටිය පාසල් හංදිය දක්වා කි. මී. 9.5ක් පමණ ගමන් කර අනතුරුව වමට හැරී තල්ගස්පිටිය පාර ඔස්සේ තංමන් හංදිය දක්වා මී. 500 ක් පමණ ඉදිරියට ගොස් තල්ගස්පිටිය මාර්ගයේ තබරව වත්ත පාර හංදිය දක්වා කි. මී. 1.5 ක් පමණ ගමන් කළ පසු වමට හැරී තබරවත්ත පාර දිගේ කි. මී. 1ක් පමණ ඉදිරියට යන විට විෂයගත දේපල පිහිටා ඇත.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළේ, තුන්පළාත පත්තුවේ, අරණායක ප්‍රාදේශීය සභා සීමාවේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44 A, හබලක්කව ග්‍රාම නිලධාරි වසම තුළ තඹරව ග්‍රාමයෙ හි පිහිටි බණ්ඩාර අරඹ නැමති

ඉඩමට, බලයලත් මිනින්දෝරු ඩී. ආර්. අමේන්ද්‍ර මහතා විසින් මැන සාදන ලද අංක 1764 සහ 2014.09.28 දින දරන පිඹුර ප්‍රකාර, කැබලි අංක 1 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ දෙමලහීරියේ සිට නිවෙස් දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර ද වන මායිම් තුළ පිහිටි රූඩ් එකක් (රූඩ්. 01) ක් විශාල ඉඩම හා ඊට අයත් නිවාස, ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියළුම දේ ද මාර්ග අයිතිය ද, සමග වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F/45/31 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මාවනැල්ල.

12-373